# 1951 ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් කරනු ලබන ඉල්ලීම්.

| ගැටලු | ඉල්ලීම් |
|---|---|
| **විවාහ වීම සඳහා අවම වයස් සීමාවක් නොතිබීම.** | • ශ්‍රී ලංකාවේ 1907 විවාහ (සාමාන්‍ය) ලියාපංදිචි කිරීමේ ආඥාපනතේ සඳහන් විවාහ වීමට තිබිය යුතු අවම වයස් සීමාව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අදාළ කිරීමට කටයුතු කළ යුතුය.<br>• අවුරුදු 12ට අඩු ගැහැණු දරුවන්ගේ විවාහ නීත්‍යානුකූල වීමේ විධිවිධාන සහ අනුමිතියන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් ඉවත් කිරීම. විවාහ වීමේ වයස තීරකාත්මකව හෝ නීතිඥ සහාය නොමැති කොමිටුවකින්, කණ්ඩායමකින් හෝ තනි පුද්ගලයෙකුට තිරණය කිරීමට ඉඩ නොදිය යුතුය.<br>• විවාහ ලියාපදිංචි කිරීමේ පෝරමයේ මනාලිය සහ මනාලයාගේ උපන් අවුරුද්ද සඳහන් කිරීම අනිවාර්ය කළ යුතුය. |
| **ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහයක් සඳහා මනාලියගේ කැමැත්ත තහවුරු කරන ඇයගේ අත්සනක් ලියාපදිංචිය සඳහා අනිවාර්ය කොට නොතිබීම.** | • ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස වැඩිහිටි මුස්ලිම් කාන්තාවන් හට විවාහ වීම සඳහා සම ස්වාධීනත්වයක් සහ තීරණ ගැනීමේ නිදහසක් හිමි විය යුතුය. මේ සඳහා ඔවුන්ට කාදිවරයෙකුගේ ගේ (මුස්ලිම් විනිසුරුවරයෙකුගේ) හෝ තම පවුලේ ඥාති පිරිමියෙකුගේ අවසරය අනිවාර්ය නොකළ යුතුය.<br>• මනාලියගේ සහ මනාලයාගේ ස්වකැමැත්ත නොමැතිව සිදුකෙරෙන කිසිදු විවාහයක් නීත්‍යානුකූල නොවිය යුතුය. විවාහය සඳහා දෙපලගේම කැමැත්ත, සාක්ෂිකරුවන් ඉදිරියේ, විවාහය ලියාපදිංචි කටයුතු කරන බලය ලත් පුද්ගලයෙකු ඉදිරියේ ඔවුන් විසින්ම ප්‍රකාශ කළ යුතු වේ.<br>• සියලුම විවාහ ලියාපදිංචි කිරීමේ ලේඛන වල මනාලිය සහ මනාලයා යන දෙපලගේම අත්සන හෝ ඇඟිලි සළකුණ අනිවාර්ය කළ යුතුය. විවාහයට සාක්ෂිකරුවන් ලෙස කාන්තා පිරිමි දෙපක්ෂයටම ඉදිරිපත් විය හැකි විය යුතු අතර සියලුම මුස්ලිම් විවාහ නීත්‍යානුකූල විවාහයක් ලෙස සැළකීම සඳහා අනිවාර්යයෙන් ලියාපදිංචි කළ යුතුවේ. |
| **විවාහ කොන්ත්‍රාත්තු සඳහා විධිවිධාන නොතිබීම.** | • ඉස්ලාමිය නීතියේ විධි නියෝගය යටතේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත, විවාහය ලියාපදිංචි කිරීමට ප්‍රථමව දෙපිරිසටම අන්‍යෝන්‍ය වශයෙන් විවාහ කොන්ත්‍රාත්තුව සකස් කිරීමට ඉඩ ලබා දිය යුතුය. උදා: බහු විවාහය වැනි විෂයයන් විවාහය ලියාපදිංචි කිරීමට ප්‍රථමව මෙම කොන්ත්‍රාත්තුවේ සඳහන් කිරීම අනිවාර්ය කළ යුතුය. |

# 1951 ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් කරනු ලබන ඉල්ලීම්.

| | |
|---|---|
| **මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිරිමින් සඳහා බහු විවාහය අනුමත කර ඇත.** | • බිරිඳගේ සහ දරුවන්ගේ ජිවිත වලට බහු විවාහ තුළින් බරපතල සමාජ ප්‍රශ්න රැසක් ඇති වන හෙයින් මෙම විවාහ ක්‍රමය මුලින් උපුටා දැමිය යුතුය. නමුත් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අනුව ශ්‍රී ලංකාවේ තවමත් මුස්ලිම්වරුන් අතර බහු විවාහ ක්‍රියාත්මක කෙරේ.  පනතේ සිදු කිරීමට බලාපොරොත්තු වන සංශෝධන තුළින් පිරිමින්ට ලැබෙන මෙම අයිතිය, අයුතු ලෙස භුක්ති විඳීමට නීතියෙන් ඉඩ නොතිබිය යුතු අතර, එය වරප්‍රසාදයක් නොව වගකීම් වලින් බැඳුණු අයිතියක් බව සවිස්තරව සඳහන් කිරීමක් කළ යුතුය.<br><br>• තවද, විවාහ ලියාපදිංචි කිරීමට ප්‍රථමව, විවාහ කොන්ත්‍රාත්තුවේ, තම ස්වාමි පුරුෂයා බහු විවාහයක් සිදු කරගන්නට අපේක්ෂා කරන්නේද යන්න, කාන්තාවකට දැණුම් දිය යුතු වේ. විවාහ කොන්ත්‍රාත්තුව තුළින් ඇයට බහුවිවාහයට ඉඩදීම, නොදීම තීරණය කිරීම සිදු කළ හැකි විය යුතුය.<br><br>• පිරිමියෙකු බහු විවාහයක් සිදු කිරීමට තීරණය කරන අවස්ථාවක, ඔහුගේ ආර්ථික තත්ත්වය, පවුල් දෙකකට එකසේ සැළකීමේ හැකියාව, දැනට විවාහක බිරිඳගේ/බිරින්දෑවරුන්ගේ සහ විවාහ කරගැනීමට නියමිත කාන්තාවගේ ලිඛිත අනුමැතිය සළකා බලා, කාදිවරයෙකුට එම අයදුම් පත්‍රය අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාව සැළසිය යුතුය. බහු විවාහයක් සිදු කිරීමේදි, සියලුම විවාහ ලියාපදිංචි පෝරමයන් වල දැනට පවතින පෙර විවාහ වල වාර්තා ඇතුළත් කිරීම අනිවාර්ය කළ යුතුය. |
| **මහර් දීමනාව (මනාලයා, මනාලියට ලබා දෙන දීමනාව ) නැවත ලබා ගැනීමේ ප්‍රමාණවත් විධිවිධාන නොතිබීම.** | • විවාහය ලියාපදිංචි කරන අවස්ථාවේ මනාලයා විසින් පොරොන්දුවන මහර් දීමනාව නියමිත කාලය ඇතුළඑ ලබා නොදුන්විට එය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු නීතිමය ක්‍රමවේද පැහැදිළිව සඳහන් කළ යුතුවේ. විවාහක සමයේ මෙන්ම දික්කසාදයකදි, කාන්තාවකට මෙම අයිතියෙන් තමාට හිමි විය යුතු වරප්‍රසාද ලබා ගැනීමට හැකි විය යුතුය. |
| **දික්කසාද දීමනා ((Mata’a) සඳහා කිසිදු අනිවාර්ය විධිවිධාන නොමැත.** | • ”තලාක්” හෝ ”ෆසා” එනම් සියලුම දික්කසාද අවස්ථාවලදී, ස්වාමි පුරුෂයාගේ වරද මත, බිරිඳට දික්කසාද දීමනාවක් ගෙවීම (Mata’a) මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් අනිවාර්ය කළ යුතුය. |

# 1951 ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් කරනු ලබන ඉල්ලීම්.

| | |
|---|---|
| **නඩත්තු කිරීමේ තත්ත්වයන් නිසිපරිදි සොයා බැලීමේ මාර්ගයක් නොතිබීම.** | • දරුපවුල නඩත්තු කිරිම සම්බන්ධ අධීක්ෂණය, සහ නිරීක්ෂණ කටයුතු නිසි පරිදි කරගෙන යාම සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත විසින් මාර්ග පද්ධතියක් ලබා දිය යුතුය.ශ්‍රී ලංකාවේ නඩත්තු පනතට අයත් සියලු මහේස්ත්‍රාත් බල තල එනම්, සේවා යෝජකයාට එරෙහිව බලාත්මක කිරීම, සැමියා හෝ බිරිඳ රටින් පිට සිටියත් ඔහුට හෝ ඇයට බලාත්මක කිරීමේ බලතල කාදි වරයාට පැවරිය යුතුය.<br><br>• නඩත්තු ගෙවීම බැහැර කර ඇත්නම්, එය නැවත ලබා ගැනීම සඳහ නීතියෙන් අවශ්‍ය විධිවිධාන තිබිය යුතු වේ. මෙම ගෙවීම්, අයදුම් පත්‍රය සම්පූර්ණ කළ දිනට සීමා නොකළ යුතුය. දැනට බිරිඳ හෝ සැමියා පදිංචි වී සිටින ප්‍රදේශයෙන්, මෙම නඩත්තු කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දිය යුතුය.<br><br>• අයදුම්කරුවාට නඩත්තු වියදම් සෘජුව බැංකු ගිණුමකට තැන්පත් කළ හැකි අවස්ථාව විධිවිධාන වලින් ලබා දිය යුතුය. |
| **ඉස්ලාමයෙන් අනුමත නොවන කයිකූලි හෙවත් දෑවැද්ද දැනට මුස්ලිම් සමාජයේ ක්‍රියාත්මකව පැවතීම.** | • දෑවැද්දක් ඉල්ලීම සහ භාරගැනීම ඉස්ලාමයෙන් අනුමත නොවන චාරිත්‍රයක් වන හෙයින් ඒ සඳහා නීතියෙන් දඬුවම් පැමිණවිය යුතු වේ. මින් කාන්තාවට බරපතල ගැටලු රැසකට මුහුණ පාන්නට සිදුවේ. මෙම චාරිත්‍රය, සමාජයෙන් ක්‍රමක්‍රමයෙන් තුරන් කිරීම සඳහා,  විවාහ ලියපදිංචි කටයුත්තේදී, දැවෑදි ගනුදෙනු (චංචල හා නිශ්චල දේපල ) සියල්ලක්ම වාර්තා කිරීම අනිවාර්ය කළ යුතු වේ.<br><br>• විවාහයේ ඕනෑම අවස්ථාවක, වෙන්වී සිටින කාල පරිච්ඡේදයේදී හෝ දික්කසාදයකදී දෑවැදි නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පැහැදිළි ක්‍රමවේදයක් තිබිය යුතු වේ.<br><br>• දෑවෑදි සහ මහර් දීමනාව (සැමියා විසින් ඉස්ලාමිය නීතිය අනුව බිරිඳට ලබා දෙන දීමනාව ) නැවත ලබා දෙන තෙක්, තලාක් හෙවත් දික්කසාදය ස්ථිර නොවේ. |
| **මුස්ලිම් සමාජයේ පවතින විවිධ නිකායන් අනුගමනය කරන ප්‍රතිපත්ති නිසා ඇතිවි තිබෙන** | • මද්හබ් 4 අතරින් (ඉස්ලාමියේ ප්‍රධාන නිකායන්) ඕනෑහමර ක්‍රමයට අනුව වඩාත් සුදුසුම නීති පද්ධතිය තෝරා ගැනීම. මෙහිදී කාන්තාවකගේ සහ දරුවන්ගේ අයිතීන් සඳහා ප්‍රමුඛත්වය දිය යුතු වේ.<br><br>• විවිධ මද්හබයින් තුළින් (නිකායන්) අපක්ෂපාති සහ ප්‍රගතිශීලි විධිවිධාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට ඇතුළත් කළ යුතු වේ. |

# 1951 ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් කරනු ලබන ඉල්ලීම්.

| | |
|---|---|
| **ව්‍යාකූල තත්ත්වය.** | • ශාෆි, හනෆි, මාලිකි, හන්බලි, ඉස්මායිලි යන ඕනෑම මද්හබයක් (නිකායක්) අනුගමනය කිරීමේ තීරණය ස්වාධීනව ගැනීම සඳහා සියලු මුස්ලිම් වරුන්ට බාධාවකින් තොරව නිදහස හිමිවිය යුතුය. |
| **මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් බැහැරව නීතිමය රැකවරණයක් බලාපොරොත්තු වීමේ විධිවිධාන නොතිබීම.** | • ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත අනිවාර්ය නොකරන්න. දෙපිරිසක් විවාහ වීමට තීරණය කළේ නම්, ඔවුන් දෙදෙනාට මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් (එඑ්) බැහැරව සාමාන්‍ය විවාහ ලියපදිංචි කිරීමේ පනත (ඨඑඝෘඨ) යටතේ විවාහය නීතිගත කිරීමේ නිදහස ලබා දිය යුතුය. මුස්ලිම් සුළුතරයක් ජීවත්වන බොහෝ රටවල, ඔවුන් රටේ පොදු නීතිය යටතේ විවාහය ලියාපදිංචි කරන අතර, සාම්ප්‍රදායික මුස්ලිම් චාරිත්‍ර වලට අනුව උත්සවය සමරයි. |
| **උපදේශක කමිටුවක් තමවත් පත් කර නොමැත.** | • රෙසිටාර් ජෙනරල්වරයාට මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සම්බන්ධයෙන් අවවාද කළ හැකි, ඒ සම්බන්ධව මනා අනුදැනුමක් සහ අත්දැකීම් අති විද්වතුන්, උපදේශක කමිටුව සඳහා බඳවා ගත යුතුවේ. මෙම කමිටුවේ අඩුම තරමේ 50% ක කාන්තා නියෝජනයක් තිබීම අනිවාර්ය වේ. |
| **කාන්තාවන්ට විවාහ රෙජිස්ට්‍රාර්වරියන්, කාතිවරියන්, ජූරි සභිකයින් හෝ කාති මණ්ඩල සාමාජිකාවන් වීමට අවසර නැත.** | • කාන්තාවන්ට විවාහ රෙජිස්ට්‍රාර්වරියන්, කාතිවරියන්, ජූරි සභිකයින් හෝ කාති මණ්ඩල සාමාජිකාවන් වීමට නීතියෙන් ඉඩ ලබා දිය යුතුය. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස, කාන්තාවකට තමාට කැමති රැකියාවක නිරත වීමේ නිදහස උල්ලංඝනය වන අවස්ථාවක් ලෙස කාදිවරයෙකුගේ තනතුර සඳහා කාන්තාවන් ප්‍රතික්ෂේප කිරීම සැළකිය හැක.<br><br>• රජයේ බදු මුදලින් වැටුප් උපයන, කාදි තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ භේදයක් ඇති කිරීමෙන්, කාන්තාවන් ඒ සඳහා නුසුදුසු යැයි සැළකීම, ශ්‍රී ලංකා වාසි සියලුම මුස්ලිම් කාන්තාවන් කෙරෙහි රජය විසින් සිදු කරන අසාධාරණයකි.<br><br>• ජූරි සභාවක් අවශ්‍ය කරන අවස්ථාවකදී, එහි අවම වශයෙන් කාන්තා ජූරි සභිකයින් දෙදෙනෙක් වත් සිටීම මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් අනිවාර්ය කළ යුතු වේ.<br><br>• කාදිවරුන්ගේ මණ්ඩලයේ 60%ක් (3/5) නීතිඥවරුන්ගෙන් සහ 40% (2/5) කාන්තා නියෝජනය තිබීම අනිවාර්ය වේ.<br><br>• කාදිවරයෙකු පත් කළ යුත්තේ නියම කරගත් සුදුසුකම් සහ හැකියාවන් පදනම් කරගනිමිනි.  සමාජයේ ජනතා |

| | |
|---|---|
| | ප්‍රසාදය ලත්, රාජ්‍ය, සමාජ සේවා, උපදේශණ සහ ආගමික නීතිය සම්බන්ධ අනුදැනුමක් ඇති, නීතික්ෂේත්‍රයේ වසර 10ක නොකැළැල් වෘත්තිමය සේවා ඉතිහාසයක් ඇති මුස්ලිම් කාන්තාවක් හෝ පිරිමියෙක් මේ තනතුර සුදුසු වේ.<br>• ප්‍රජා නිර්දේශකයින් විසින් කාදි තනතුර සඳහා අයදුම් පත් ලබාදීමේදි සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදි, ක්‍රමවත් පිළිවෙතක් සහ ලිඛිත සංරචකයක් අනිවාර්ය කළ යුතු වන අතර තෝරාගත් කාදි වරුන්ට විධිමත් පුහුණුවීම් නිරන්තරයෙන් ලබා දිය යුතු වේ.<br>• කාදි අධිකරණයේ සාමාජිකයින්ට ඔවුන්ගේ සේවාවේ ගුණාත්මක භාවය වැඩි කිරීමේ අරමුණින්, පාරිතෝෂිකයක් ලබා දිය යුතුය.<br>• මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතින් සියලුම කාදිවරුන්ට අනිවාර්ය පුහුණුව ලබා දීම, රාජකාරිය භාර ගැනීමට ප්‍රථමව ආචාර ධර්ම, නීතිය සහ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ඉල්ලීම්වලට සංවේදී වීම පිළිබඳ දැනුවත් කිරීම, කාදි අධිකරණයේ පෞද්ගලිකත්වය සහ රහසිගතභාවය ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන ඇති කළ යුතුය.<br>• අධිකරණයේ ක්‍රියාවලින්ට සම්බන්ධ වන පුද්ගලයින්ට විවිධ අන්දමේ දික්කසාද, නඩත්තු කිරීම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කාදිවරුන්ට හැකි විය යුතුය. ගෘහස්ථ හිංසනය සම්බන්ධ ගැටලු පොලිසිය වෙත වාර්තා කළ යුතුය.<br>• කාදි අධිකරණ කටයුතු පරික්ෂා කිරීමේදි, අධිකරණ සේවා කොමිසමට(ජීක) ක්‍රමවත් යාන්ත්‍රණයක් තිබිය යුතුය.<br>• සියලුම කාදි අධිකරණයන්හි, මුස්ලිම් කාන්තාවන් නියෝජනය කළ හැකි කාන්තා උපදේශකවරියන් සිටීම අනිවාර්ය වේ. |
| **කාදි අධිකරණ ප්‍රවේශය නඩත්තු කිරීම.** | • මහේස්ත්‍රාත්, දිස්ත්‍රික් අධිකරණ ක්‍රියාපටිපාටින් මෙන් කාදි අධිකරණයේ තත්ත්වය වෙනස් නොකරන්න.<br>• කාදි අධිකරණයට නීතිමය නියෝජනයක් හඳුන්වාදීමෙන් වැළකිය යුතුය.<br>• ඉහත සඳහන් වෙනස් කිරීම් තුළින් කාදි අධිකරණයෙන් පසිඳලන යුක්තියේ තත්ත්වය ඉහළ නැංවෙන අතර නඩු කියන්නාට කාදි අධිකරණයට ඇති ප්‍රවේශය (දුර, වේලාව සහ ගමනාගමනය ) ගැටලුකාරි නොවේ. නීතිමය නියෝජනය හඳුන්වා දීම සහ එය විධිමත් කිරීමෙන්,යුක්තිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ අමතර වියදමක් සහ අනවශ්‍ය ප්‍රමාදයක් ඇතිවේ. |

# 1951 ශ්‍රී ලංකා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් කරනු ලබන ඉල්ලීම්.

| | |
|---|---|
| **කාදි අධිකරණවල විධිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් නොතිබීම.** | • කාදි අධිකරණය ක්‍රියාපටිපාටින් සහ වාර්තා විධිමත් ලෙස අධීක්ෂණය කිරීම සඳහා නිසි පද්ධතියක් ආරම්භ කළ යුතුය. අධීක්ෂණ තුළින් ලබාගත් නිරීක්ෂණ වාර්තා පුහුණු කිරීම් වලදී ආධාරයක් ලෙස යොදාගත යුතු අතර හදිසි, බරපතල නිරවද්‍යතාවක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ නම්, වගකිව යුතු අධීක්ෂක ඒ සම්බන්ධයෙන් අධිකරණයට ඍජුව දැනුවත් කළ යුතුවේ.<br><br>• අධිකරණ සේවා කොමිසම විසින් භාරගන්නා  පැමිණිලි වාර්තා/ යාන්ත්‍රණ පිළිබඳ මහජන පැමිණියාව දැනුවත් විය යුතු වේ. භාරගන්නා පැමිණිලි වල ස්වභාවය පැහැදිලි විය යුතුය. කාදි වරුන්ගේ ක්‍රියා පටිපාටින් සම්බන්ධ පැමිණිලි මීට අයත් වන අතර අභියාචනයක් බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි මෙහිදී අදාළ නොවේ. උදාහරණයක් ලෙස, උසාවිය ඉදිරියේ (උසාවිය තුළ හෝ බැහැරව ) අපයෝජනයට, විවිධ අඩම් තේට්ටම් හා ලිංගික හිංසනය සහ වංචා වලට ලක්වූ පුද්ගලයින්.<br><br>• කාදිවරුන්ට එරෙහිව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිසම නිසි විනය පරීක්ෂණයක් සිදු කර ඊට එරෙහිව පියවර ගත යුතුය. |